**08-01-2023 මධුබන් අව්‍යක්ත් බාප්දාදා ඕම් ශාන්ති 1993/04/23**

**ඔබට විශ්වාසයෙන් පිරි බුද්ධියක් තිබේවා! ඔබ අමරණීය වේවා!**

(රිදී ජුබිලිය සැමරීමට පැමිණ සිටි සියලුම ජ්‍යෝෂ්ඨ සහෝදර සහෝදරියන්ගේ සෙනෙහසින් පිරි ආරාධනාව පිළිගෙන, අව්‍යක්ත බාප්දාදා දරුවන්ගේ සමූහය තුළට පැය භාගයකට පැමිණියා, සියලු දෙනාට මිහිරි දෘෂ්ඨි දීමෙන් පසුව ශ්‍රේෂ්ඨ වදන් කිහිපයක් පැවසුවා. අවසානයේ බාබා අත වනා, සියලු දෙනාගෙන් සමුගත්තා.)

අද, බාප්දාදා සියලුම උපරිම ලෙස ආදරණීය ජීවාත්ම, ආරම්භයේ සිටම යග්‍යාවේ ස්ථාපනයට සහයෝගී වී ඇති, ඔවුන්ගේ බුද්ධිය තුළ විශ්වාසය තිබීමේ පදනමින් ජයගෙන ඇති සහ බොහෝ විවිධ අන්දමේ ගැටළු වල ප්‍රශ්න පත්‍ර සමත් වී ඇති, එමෙන්ම ආරම්භයේ සිටම ආදරණීය, සහයෝගී, අචල සහ නොසැලී හිඳ ඇති එම ජීවාත්ම සමග හමුවක් සැමරීමට පැමිණ ඇත. විශ්වාසය යන විෂයෙන් සමත් වීමෙන් පසුව, ගමන් කරන එම දරුවන් වෙතට බාබා පැමිණ ඇත. මෙම විශ්වාසය, මේ ජීවිතයේ සහ ඔබගේ අනාගත උපත් වලදී ඔබට නිරන්තරයෙන් නොකඩවා ජයග්‍රහණයේ අත්දැකීම ලබා දෙයි. විශ්වාසයේ සහ අමරණීයත්වයේ ආශිර්වාදය නිරතුරුවම ඔබ සමග තිබේ. අද බාබා විශේෂයෙන් පැමිණියේ, අත්දැකීම් ඇති පරිණත ජීවාත්මයන්ගේ (මහළු බ්‍රහ්මිණ්වරුන්ගේ) දිගු කාලීන සිහි කිරීම සහ සෙනෙහස් බන්දනය නිසයි. ඔබගේ විශ්වාසය වෙනුවෙන් සුබ පැතුම්!

එක පැත්තකින්, යග්‍යාවේ අත්තිවාරමේ ජීවාත්ම සිටින අතර, එනම්, පාණ්ඩව බලකොටුවේ අය බාබා ඉදිරියේ සිටින අතර අනෙක් පැත්තේ ඔය සියලුම අත්දැකීම් ඇති මුල් ආරම්භක ජීවාත්ම, පාණ්ඩව බලකොටු බැම්මේ ප්‍රථම ගඩොල් සිටියි. අත්තිවාරම බාබා ඉදිරියේ සිටින අතර එහි පදනමට අනුව, බලකොටුව ශක්තිමත් සහ ලෝකයට ආරක්ෂක වියනක් බවට පත් වී ඇති ප්‍රථම ගඩොල්ද බාබා ඉදිරියේ සිටියි. එබැවින්, දරුවන්ට ඇති සෙනෙහස නිසා බාබා, 'ජී හසූර්, හජීර්' (ඔව්, මගේ ස්වාමී, මා පෙනී සිටිනවා) යන කොටස ප්‍රායෝගිකව පෙන්වා දරුවන් ඉදිරියේ පෙනී සිටිනසේම, බාප්දාදා සහ උපකරණ ජීවාත්මයන්ගේ ශ්‍රීමත් සහ උපදෙස් වලට 'ජී හසීර්' (පෙනී සිටිනවා ස්වාමී) කියා, නිරන්තරයෙන් නොකඩවා පවසන්න. කිසිම විටෙක මෙය සමග නිෂ්ඵල මන්මත් හෝ පරමත් මිශ්‍ර නොකරන්න. ශ්‍රීමත් අනුගමනය කිරීමේ පදනමට අනුව, ස්වාමී පෙනී සිටින බව දැනගෙන, අඛණ්ඩව පියාසර කරන්න. සම්ජා! (වැටහුණාද?) අච්චා.

ඔවුන්ගේ සේවය වෙනුවෙන් සුබ පැතුම් ලබා දෙන අතර බාප්දාදා මධුබාන් නිවැසියන්ට කතා කරමින්:

අච්චා, විශේෂයෙන් මධුබාන් නිවැසියන්ට බොහෝ සුබ පැතුම්. මුළු වාරය පුරාම ඔබගේ මිහිරියාවෙන් සහ වෙහෙස නොබලා කරන සේවයෙන්, ඔබ, සියලු දෙනාට සේවය කිරීමට උපකරණ වී ඇත. එබැවින් විශේෂයෙන් මධුබාන් නිවැසියන්ට බොහෝ සුබ පැතුම්, මන්ද, මුළු ඍතුවටම උපකරණ සේවකයන් වන ප්‍රථම අය ඔවුන්ය. මධුබාන් මී පැණිය, එනම්, මිහිරියාවයි. මිහිරි බව, සෑම කෙනෙකුටම, පරම පියාට සෙනෙහස දැක්වීමට මහපාදයි, මේ නිසයි ඔවුන් ශාලාවේ අසුන්ගෙන සිටියත්, පිටව ගොස් ඇතත්, ඔවුන්ගේ සේවය වෙනුවෙන් බාප්දාදා සෑම දෙපාර්තමේන්තුවකටම මෙම ආශිර්වාදය සමග සුබ පැතුම් ලබා දෙනවා, 'ඔබට වෙහෙස නොදැනී, මිහිරි වේවා' එමෙන්ම අඛණ්ඩව ඉදිරියට ගමන් කරමින් පියාසර කරන්න.

**අව්‍යක්ත බාප්දාදා සමග පෞද්ගලික හමුවීම්:**

1) නොසැලකිල්ල, දුර්වලතා ගෙන එයි, එබැවින් අවදි සිහියෙන් සිටින්න.

ඔබ සියලු දෙනාම සංගම යුගයේ ශ්‍රේෂ්ඨ ජීවාත්ම නේද? වෙනත් කිසිම යුගයකට නොමැති, සංගම යුගයේ විශේෂත්වය කුමක්ද? සංගම යුගයේ විශේෂත්වය වන්නේ, ඔබට ක්ෂණික ඵල ලැබීමයි, තවද ඔබ මේ උපතේදීම එකක් වෙනුවෙන් කෝටි ගුණයක ප්‍රතිලාභයක් අත්විඳියි. ඔබට ක්ෂණික ඵල ලැබෙනවා, එහෙම නේද? ඔබට තත්පරයක හෝ එඩිතරකම ඇත්නම්, තව කෙතරම් කාලයක් ඔබට නොකඩවා උපකාර ලැබෙනවාද? ඔබ එක පුද්ගලයෙකුට පවා සේවය කළ විට, ඔබට බොහෝ සතුට ලැබෙයි. එබැවින් එකක් වෙනුවෙන් කෝටි ගුණයක ලැබීම් යනු, ඔබට සංගම යුගයේදීම ක්ෂණික ඵලය ලැබෙයි. ඉතිං, නැවුම් පලතුරු

කැමෙන් ඔබ විනෝදයක් ලබනවා නේද? එබැවින් ඔබ සියලු දෙනාම ක්‍ෂණික පලතුරු බුදින අයයි, එනම් නැවුම් පලතුරු, ඔබ බලවත් වන්නේ ඒ නිසයි. ඔබ දුර්වල නැහැ නේද? ඔබ සියලු දෙනාම බලවත්ය. කිසිම දුර්වලතාවයකට පැමිණීමට ඉඩ නොදෙන්න. ඔබ නිරෝගී වන විට, දුර්වලතා ඉබේම අවසන් වෙයි. ඔබට නිරන්තරයෙන් අඛණ්ඩව සර්ව බලධාරී පියාගෙන් බලය ලැබෙයි, එබැවින්, ඔබ දුර්වල වන්නේ කෙසේද? දුර්වලතා වලට පැමිණිය හැකිද? එය වැරදීමකින් පැමිණෙනවාද? ඔබ නොසැලකිලිමත් වී කුම්භකරණ මෙන් නින්දට යන්නේ නම් එයට පැමිණිය හැක, එසේ නැත්නම් එයට පැමිණිය නොහැක. ඔබ සියලු දෙනාම සිටින්නේ අවදි සිහියෙන් නේද? ඔබ නොසැලකිලිමත්ද? ඔබ සියලු දෙනාම සිටින්නේ අවදි සිහියෙන්ද? ඔබ සැම විටම සිටින්නේ අවදි සිහියෙන්ද? සංගම යුගයේ ඔබට පියාව හමු වූ විට ඔබට සියල්ල හමුවිය. එබැවින් ඔබ අවදි සිහියෙන් සිටිනවා නේද? නොකඩවා මෙතරම් ලැබීම් රාශියක් ලැබෙන අය, බොහෝ අවදියෙන් සිටියි! ව්‍යාපාරිකයන් ඔවුන්ගේ ව්‍යාපාරයෙන් ලාභ ලබන විට, ඔවුන් නොසැලකිලිමත් වෙයිද, අවදියෙන් සිටියිද? එබැවින් ඔබට තත්පරයකදි කෙතරම් හිමි වෙනවාද? එසේ නම් ඔබ නොසැලකිලිමත් වන්නේ කෙසේද? පරම පියා ඔබට සියලු ලැබීම් ලබා දී තිබේ. සියලු බල ඔබ සමග බැවින්, නොසැලකිල්ලට පැමිණිය නොහැක. සැම විටම දක්‍ෂ වන්න, සැම විටම ප්‍රවේසම් වන්න!

බාප්දාදා සැම විටම පවසන්නේ: 'යූ.කේ. ඕකේ බවයි'. එබැවින් ඕකේ අය, (හොඳින් සිටින අය) ඕකේ වන්නේ ඔවුන් අවදියෙන් සිටින නිසයි. අත්තිවාරම ශක්තිමත්ය, මේ නිසයි මතු වී ඇති සියලුම අතු රිකිලිද ශක්තිමත්ව තිබෙන්නේ. බාබා සහ බ්‍රහ්ම පියා තම හදවතින්, ලන්ඩන් නුවර ප්‍රථම අත්තිවාරම තබා ඇත. එයට බ්‍රහ්ම පියාගේ විශේෂ සෙනෙහස ලැබෙයි. එබැවින් ඔය ජීවාත්මයන්ටත් ක්‍ෂණික ඵලයට අයිතියක් තිබෙනවා. ඔබ යම් ක්‍රියාවක් කිරීමටත් පෙර, එහි ඵලය ඔබ වෙනුවෙන් සූදානම්ය. එය එසේ දැනෙනවා නේද? එසේ නැත්නම් එය වෙහෙසකාරී ක්‍රියාවක් ලෙස දැනෙනවාද? ගී ගයමින් නටමින් සිටින අතර ඔබ නොකඩවා ඵලය බුදියි. කෙසේවෙතත්, ඔය ද්විත්ව විදේශිකයන් පලතුරු වලට ප්‍රිය කරනවා නේද? යූ.කේ වල සිටින, එබැවින් ඕකේව (හොඳින්) සිටින දරුවන් දැකීමෙන් බාප්දාදාද සතුටු වනවා. සැම විටම ඔබගේ මෙම නම්බු නාමය සිහියේ තබා ගන්න. එය හොඳම නම්බු නාමයයි. ඔබ සියලු දෙනා නිරතුරුවම ඕකේ ලෙස සිටින, එමෙන්ම ඔබගේ මුහුණු, ඔබගේ වදන් සහ ආකල්ප තුළින් අන් අයවත් ඕකේ කරවන අයයි. ඔබ කළ යුතු සේවය මෙයයි, එහෙම නේද? එය හොඳයි, එමෙන්ම සේවය කිරීමට ඔබට හොඳ උනන්දුවක් තිබෙනවා. කොහේ සිට ඔබගෙන් කවුරු පැමිණියත්, ඔබ සියඛ දෙනාම තීව්‍ර උත්සාහ දරන්නන් මෙන්ම පියාසර ස්ථිතියේ අයයි. වඩාත්ම සතුටින් රැඳී සිටින්නේ කවුද? කුල්මත් බවින් මෙසේ කියන්න, 'ඒ මමයි.' සතුට හැර, වෙන ඇත්තේ කුමක්ද? බ්‍රහ්මිණ් දිවියේ පෝෂණය සතුටයි. ඔබගේ පෝෂණය නොමැතිව ඔබ ගමන් කරන්නේ කෙසේද? ඔබ ගමන් කරමින් සිටිනවා, නමුත් ඔබ ගමන් කරන්නේ ඔබට පෝෂණය ලැබෙන නිසයි. ස්ථානද වැඩි වෙනවා. බලන්න, පෙර කල අඩි තුනක භූමි ප්‍රමාණයක් ලබා ගැනීම ලොකු දෙයක් වූ අතර දැන් එය හැඟෙන්නේ කෙසේද? එය පහසු බව දැනෙනවා නේද? ඉතිං, ලන්ඩන් ආශ්චර්ය සිදුකර තිබෙනවා. (අපට දැන් අක්කර 50ක භූමියක් ලැබී තිබෙනවා - ග්ලෝබල් රිට්‍රීට් මධ්‍යස්ථානය මිල දී ගැනීම). අන් අයට ධෛර්යය ලබා දෙන අය හොඳ වන අතර ධෛර්යවන්තව රැඳී සිටින අයත් හොඳයි. බලන්න, සැම කෙනෙකුගේම අතැඟිල්ලක සහාය නොතිබුණා නම් එය සිදු වන්නේ කෙසේද? එබැවින් යූකේ වල ඔබ සියලු දෙනාම වාසනාවන්තයි එමෙන්ම ඔබගේ අතැඟිල්ලක සහාය ලබා දීමේදි එඩිතරයි.

2) ඔබගේ සියලුම වගකීම් පියාට භාරකර සැහැල්ලු අධිරාජවරුන් වන්න.

තමන් නිරන්තරයෙන් සැහැල්ලු අධිරාජවරුන් බව ඔබ අත්විඳිනවාද? නැත්නම් කණස්සලු ටිකක් තිබෙනවාද? පියා ඔබගේ වගකීම් ගෙන ඇති බැවින් වගකීම් ගැන ඔබ කරදර වන්නේ ඇයි? ඔබට දැන් තිබෙන එකම වගකීම වන්නේ පරම පියා සමග එකට ගමන් කිරීමයි. එයත්, තනිව නොවෙයි, පියා සමග එකට ගමන් කිරීමය. එබැවින්, ඔබට ඇති කරදර මොනවාද? හෙට සිදු වීමට යන්නේ කුමක්ද කියා ඔබ කණස්සලු වෙනවාද? ඔබගේ රැකියාව ගැන ඔබ කණස්සල්ලට පත් වෙනවාද? ලෝකයේ සිදු වීමට යන දේ ගැන ඔබට කණස්සල්ලක් තිබෙනවාද? සිදුවීමට යන්නේ කුමක් වුවත්, එය ඔබට හොඳක් වන බව ඔබ දන්නවා. ඔබට මෙම විශ්වාසය තිබෙනවා නේද? එය ස්ථිර විශ්වාසයක්ද නැත්නම් එය විටෙක සැලෙනවාද? ස්ථිර විශ්වාසය ඇති තැන, එම විශ්වාසය නිසා ජයග්‍රහණය සහතිකයි. ජයග්‍රහණය සහතික බවට විශ්වාසයත් ඔබට තිබෙනවා නේද? එසේ නැත්නම් ඔබට ජය ලැබෙයිද නැද්ද කියා ඔබ විටෙක සිතනවාද? ඔබ සැම කල්පයකදීම ජය ලබන අතර එය සැම විටම සිදු වෙයි. ඔබගේ පෙර කල්පයේ සිහිවටනය ඔබ නැවත වරක් දකිනවා නේද? ඔබ

සෑම කල්පයකදීම ජයග්‍රහණය කරන බවට මෙම විශ්වාසය, ඔබට තිබෙනවා නේද? ඔබට මෙතරම් විශ්වාසයක් තිබෙනවාද? පෙර කල්පයේ සිටියෙත් ඔබමයි, එහෙම නේද? නැත්නම් ඒ වෙන කෙනෙක්ද? එබැවින් බුද්ධියේ විශ්වාසය තිබෙන ජයග්‍රාහී මැණික් ඔබ බව, සෑම විටම මතකයේ තබා ගන්න. බාප්දාදා පවා ඔබව සිහි කරන්නේ ඔබ එවන් මැණික් නිසයි. ඔබට මෙම සතුට තිබෙනවා නේද? ඔබ බොහෝ ප්‍රීතිමත්ව සිටිනවා නේද? මෙම අලෞකික, දිව්‍යමය ශ්‍රේෂ්ඨ උපතට සහ ඔබගේ මධුබාන් නිවසට ළඟා වීම වෙනුවෙන් සුබ පැතුම්.

3) පියා සහ මම - කිසිම කෙනෙකුට ඔබව වෙන් කළ නොහැකි සේ එවන් ආකාරයකට ඒකාබද්ධව රැඳී සිටින්න.

ඔබ නිරන්තරයෙන් පරම පියා සමග ඒකාබද්ධව සිටින බවට අත්දැකීම ඔබ සියලු දෙනාටම තිබෙනවාද? ඒකාබද්ධ වී සිටින අයව කිසිවෙකුට කිසිදා වෙන් කළ නොහැක. ඔබ බොහෝ වාර ගණනාවක් ඒකාබද්ධ වී හිඳ ඇති අතර ඔබ දැන්ද එසේ සිටින අතර අනාගතයේද සෑම විටම එසේ වෙයි. මෙය ස්ථිරද? එබැවින් නිරන්තරයෙන් ඉතා ශක්තිමත්ව ඒකාබද්ධ වී රැඳී සිටින්න. එබැවින් සෑම විටම මෙම අවධානයෙන් සිටින්න: අප ඒකාබද්ධව සිටියා, අප ඒකාබද්ධව සිටිනවා, එමෙන්ම අප නිරන්තරයෙන් ඒකාබද්ධ වී සිටිනු ඇත. අනේක වාරයක් ඒකාබද්ධව හිඳ ඇති අයව වෙන් කිරීමට කිසිවෙකුටත් බලය නොමැත. සෙනෙහසේ ලක්ෂණය කුමක්ද? (ඒකාබද්ධව රැඳී සිටීම). ශාරීරිකව, යම්කිසි බලපෑමක් නිසා වුවද, ඔබට ඇතැම් විට වෙන්ව සිටීමට සිදුවෙයි. සෙනෙහස ඇති නමුත් ඇතැම් අවස්ථාවන්හි ඔබට වෙන්ව සිටීමට සිදුවෙයි. කෙසේවෙතත් මෙහිදී, එය (භෞතික) ශරීරය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. ඔබට යම් දුර තැනකට තත්පරයකදි වුවත් යා හැක. පරමාත්ම දෙවියන් සමග ජීවාත්මයන්ගේ ඇසුර තිබෙනවා. පරමාත්ම දෙවියන් ඕනෑම තැනකදි ඔහුගේ ඇසුරේ වගකීම ඉටු කරන අතරම ඔහු සෑම කෙනෙක් සමග, ඒකාබද්ධ ස්වරූපයේ සෙනෙහසේ වගකීමත් ඉටු කරනවා. එක් එක් කෙනා කුමක් කියයිද? 'මගේ බාබා' එසේ නැත්නම් ඔවුන් කියන්නේ 'ඔබගේ බාබා' කියාද? සෑම කෙනෙක්ම පවසන්නේ 'මගේ බාබා'. එසේ නම් 'ඔබ මගේ' කියා කියන්නේ මන්ද? ඔබ මෙසේ කියන්නේ ඔබට අයිතියක් ඇති නිසයි. ඔබට සෙනෙහස තිබෙන අතර ඔබට අයිතියක්ද තිබේ. සෙනෙහස ඇති තැන, අයිතියක්ද තිබේ. මෙම අයිතිය තිබීමේ කුල්මත් බව ඔබට තිබෙනවා නේද? ඔබට විශාල අයිතියක් හිමි වී තිබේ. ස්වර්ණමය යුගයේ වත් ඔබට මෙතරම් විශාල අයිතියක් ලැබෙන්නේ නැහැ. වෙනත් කිසිම යුගයකදි ඔබට දේවමය අයිතීන් නොමැත. ඔබට මෙම ලැබීම තිබෙන්නේ මෙහිදීය. ප්‍රතිලාභය තිබෙන්නේ ස්වර්ණමය යුගයේ නමුත් ලබා ගැනීමේ කාලය දැන්ය. ඉතිං ඔබ යමක් අත්කර ගන්නා විට බොහෝ සතුට තිබෙයි. ඔබ යමක් අත්කර ගත් පසුව එය සාමාන්‍ය දෙයක් බවට පත් වෙනවා, නමුත් ඔබ යමක් ලබමින් සිටින විට, එම කාලයේ කුල්මත් බව සහ සතුට, අලෞකිකයි. ඉතිං, ඔබට බොහෝ සතුට සහ කුල්මත් බව තිබේ, මන්ද, ලබා දෙන ඒකායන කෙනාද අසීමිතයි. ඉතිං පිරිනමන්නා අසීමිත වන අතර ඔබට ලැබෙන දෙයත් අසීමිතයි. එසේ නම් ඔබ පාලකයෙක් වන්නේ කුමකද? සීමිත දෙයකද, අසීමිත දේකද? ඔබ තුන් ලෝකයම ඔබට අයිති කරගත්තා. අශාරීරික ලෝකය සහ සූක්ෂම කලාපය ඔබගේ නිවහන්ය. ඔබගේ රාජධානිය පැමිණීමට යන්නේ භෞතික ලෝකයේය. එබැවින් ඔබට ලෝක තුනටම අයිතියක් තිබෙනවා. එසේ නම් ඔබ කවුරුන්ද? අයිතියක් ඇති ජීවාත්ම. ඔබට කිසිම දෙයක අඩුවක් තිබෙනවාද? ඔබ ගායනා කරන්නේ කුමන ගීතයද? (මට අත්කර ගැනීමට අවශ්‍ය වූ දේ මා අත්කර ගත්තා). මට අවශ්‍ය වූ දේ මා ලබා ගත්තා, දැන් ලබා ගැනීමට කිසිවක් ඉතිරිවී නැහැ. එසේ නම් ඔබ මෙම ගීතය ගායනා කරනවාද? නැත්නම් ඔබට යම් දෙයක අඩුවක් තිබෙනවාද? 'මට මුදල් ඕනෑ, මට ගෙයක් ඕනෑ. මට දේශපාලකයෙකුගේ ආසනය ඕනෑ.' ඔබට කිසිවක් අවශ්‍ය නැහැ, මන්ද, ඔබට යම් තත්ත්වයක අසුනක් තිබුණත්, එහි එක උපතකටවත් සහතිකයක් නොමැති නමුත් ඔබට කෙතරම් සහතිකයක් තිබෙනවාද? ඔබට උපත් 21ක සහතිකයක් තිබෙනවා. ඔබගේ ගමන් බලපත්‍රය නැති වූ විට සෑම දෙයක්ම අපහසු වන සේම, මායා ඔබගේ සහතික පත සොරාගෙන නැහැ නේද? එබැවින්, මායා ඔබගේ සහතික පත අරගෙන නැහැ නේද? ඇය හැංගිමුත්තන් සෙල්ලම් කරයි. එවිට ඔබ කරන්නේ කුමක්ද? මායාට එඩිතරකමක් නොමැති වන අන්දමින් බොහෝ සේ බලවත් වන්න.

4) සෑම ක්‍රියාවක්ම ත්‍රිකාලදර්ශීවරයෙක් ලෙස සිදු කරන්න.

ඔබ සියලු දෙනාම ඔබගේ සිහසුන මත අසුන්ගෙන සිටින ජීවාත්ම බව අත්විඳිනවාද? ඔබ කියන්නේ කුමක්ද: ඔබගේ සිහසුන ඔබට දැන් ලැබී තිබෙනවාද, නැත්නම් ඔබට එය ලැබෙන්නේ අනාගතයේද? සෑම කෙනෙක්ම

සිහසුනක් මත අසුන් ගනීද? (හදවත් සිහසුන ඉතා විශාලයි). හදවත් සිහසුන විශාලයි, නමුත් කී දෙනෙක් එකවර ස්වර්ණමය යුගී සිහසුන මත අසුන් ගනීද? ඕනෑම කෙනෙකුට සිහසුන මත අසුන් ගත හැකි නමුත්, ඔබ සිහසුනට අයිතියක් ඇති අයගේ රාජකීය පවුලේ කොටසක් වෙනවා නේද? ඔබට එකවර සිහසුන මත අසුන් ගැනීමට නොහැකි වෙයි, එහෙම නේද? මෙකල ඔබ සියලු දෙනාම සිහසුනක් මත අසුන්ගෙන සිටිනවා, ඒ නිසයි මෙම උපතට වැදගත්කමක් තිබෙන්නේ. ඕනෑම සංඛ්‍යාවකට සහ අවශ්‍ය ඕනෑම කෙනෙකුට හදවත් සිහසුන මත අසුන් ගත හැක. මෙකල වෙනත් සිහසුනක් තිබෙනවාද? කුමන එකද? (අකාල් තක්ත් - අමරණීය සිහසුන). ඔය අවිනාශී ජීවාත්මයන්ගේ සිහසුන නළලයි. එබැවින් ඔබ නළල් සිහසුනේ අසුන්ගෙන සිටින අතර හදවත් සිහසුනේද අසුන් ගෙන සිටිනවා. ඔබට ද්විත්ව සිහසුන් තිබෙනවා, එහෙම නේද? නළලේ ඇති අමරණීය සිහසුනේ අසුන්ගෙන සිටින ජීවාත්මයක් වීමේ කුල්මත් බව ඔබට තිබෙනවාද? සිහසුන මත අසුන්ගෙන සිටින ජීවාත්මයකට තමන් මත ආධිපත්‍යයක් තිබෙනවා, එවන් ජීවාත්මයක් තමන්ගේ පාලකයෙක් වන්නේ ඒ නිසයි. ස්ව-ආධිපත්‍යයේ අවධානය තිබීම, පරම පියාගෙන් ලැබෙන සියලු ලැබීම් වල අත්දැකීම ඔබට පහසුවෙන් ගෙන දෙයි. එබැවින් ඔබට සිහසුන් තුනම පිළිබඳ දැනුම තිබෙනවා. ඔබ දැනුමින් පිරිපුන්ය, එහෙම නේද? තවද ඔබ බල වලින් පිරිපුන්ද, නැත්නම් ඔබ දැනුමින් පමණක් පිරිපුන්ද? ඔබ දැනුමින් පිරිපුන් තරමටම බලයන්ගෙන් පිරිපුන්ද, නැත්නම් ඔබ දැනුමින් වැඩියෙන් පිරිපුන් වන අතර බල වලින් අඩුවෙන් පිරිපුන්ද? ඔබ දැනුම අතින් වැඩියෙන් දක්ෂයි. ඔබ දැනුමින් පිරිපුන් මෙන්ම බලයෙන්ද පිරිපුන්ය. - දෙකම. එබැවින් නිරන්තරයෙන් සිහසුන් තුනම පිළිබඳ අවධානයෙන් සිටින්න.

දැනුමෙහි, ත්‍රිත්වයේ වැදගත්කම තිබේ. ඔබ තුන් කාලය ගැන දන්නවා. එසේ නැත්නම් ඔබ දන්නේ වර්තමාන කාලය ගැන පමණයිද? ඔබ ඕනෑම ක්‍රියාවක් සිදු කරන විට ඔබ එය කරන්නේ ත්‍රිකාලදර්ශීවරයෙක් ලෙසින්ද නැත්නම් ඔබ ක්‍රියා කරන්නේ එක කාලයක් ගැන පමණක් දැනුවත්ව සිටද? ඔබ කවුරුන්ද - එක කාලයක් පිළිබඳ දන්නා අයද, තුන් කාලය පිළිබඳව දන්නා අයද? හෙට සිදු වීමට යන්නේ කුමක්ද කියා ඔබ දන්නවාද? ඔබ පවසන්නේ: හෙට සිදු වීමට යන කුමක් වුණත් ඉතා හොඳ වන බව අපි දන්නවා. ඔබ මෙපමණක් දන්නවා නේද? එබැවින් එය ඔබව ත්‍රිකාලදර්ශී කරවනවා නේද? දැනටමත් සිදුව ඇති කුමක් වුණත් හොඳ වූ අතර සිදු වෙමින් පවතින කුමක් වුණත් ඊට වඩා හොඳයි, එමෙන්ම සිදු වීමට යන දේ ඉතා හොඳ වෙයි. කුමක් සිදු වුණත් එය හොඳම දේ වන බවට විශ්වාසය ඔබට තිබෙනවා නේද, කිසිම නරකක් සිදුවිය නොහැකි බව? ඇයි? ඔබට සියල්ලටම වඩා හොඳම පියාව හමුවී තිබේ, ඔබ හොඳම අය බවට පත් වී ඇත, එමෙන්ම ඔබ හොඳම ක්‍රියා සිදුකරමින් සිටිනවා. එබැවින් සෑම දෙයක්ම හොඳයි, එහෙම නේද? එසේ නැත්නම් එය ටිකක් නරක සහ ටිකක් හොඳයිද? ඔබ ශ්‍රේෂ්ඨ ජීවාත්ම බව ඔබ දන්නා බැවින්, එවිට ශ්‍රේෂ්ඨ ජීවාත්මයන්ගේ සිතිවිලි, වචන සහ ක්‍රියා, හොඳම ඒවා නේද? එබැවින් ඔබට හිතකාමී පියාව හමු වී ඇති නිසා, සෑම විටම තිබෙන්නේ යහපතක්ම සහ වඩාත්ම යහපතක් යන අවධානය නිරන්තරයෙන් තබා ගන්න. පියා හැඳින්වෙන්නේ ලොවට යහපත සලසන්නා ලෙස වන අතර ඔබ මාස්ටර් ලොවට සෙත සලසන්නන්ය. ලොවට සෙත සලසන අය ඔබ බැවින්, යහපතක් නොමැති කිසිවක් ඔබට සිදුවිය නොහැක. මේ නිසයි සෑම මොහොතක්, සෑම කාර්යයක් සහ සෑම සිතිවිල්ලක්ම යහපතක්ම ගෙන එන්නක්, යන විශ්වාසය ඔබට තිබිය යුත්තේ. සංගම යුගය, යහපත ගෙන එන යුගය ලෙසද හැඳින්වෙයි. එබැවින් ලැබීමක් නැති කිසිවක් තිබිය නොහැක. එසේ නම්, ඔබ සිහි කරන්නේ කුමක්ද? සිදුවන සහ සිදු වීමට යන කුමක් වුණත්, එය හොඳම දේ වනු ඇත. මෙම අවධානය ඔබව නිරන්තරයෙන් අඛණ්ඩව ඉදිරියට ගමන් කරවයි. අච්චා. ඔබ පරම පියාගේ ධජය ලොවෙහි සෑම තැනකම ඔසවනවා. ඔබ සියලු දෙනාම එඩිතරකමින් සහ තීව්‍ර උත්සාහයෙන් ඉදිරියට ගමන් කරන අතර ඔබ නොකඩවා ඉදිරියට ගමන් කරනු ඇත. ඔබට අනාගතය පෙනෙනවා නේද? ඔබගේ අනාගතය කුමක්ද කියා ඕනෑම කෙනෙක් ඔබගෙන් විමසන්නේ නම්, ඔවුන්ට කියන්න: එය හොඳම බව අපි දන්නවා.

**වරදානය:** ඔබගේ නළලේ ඔබගේ ශ්‍රේෂ්ඨ භාග්‍යයේ රේඛාව දැක, ඔබ සැහැල්ලු අධිරාජයෙක් සහ සියලු කණස්සලු වලින් නිදහස් වේවා.

සැහැල්ලු වීමේ ආධිපත්‍යය, සියල්ලට වඩා උසස්ම ආධිපත්‍යයයි. කෙනෙක් කිරුළක් පැළඳ, සිහසුනක් මත අසුන් ගන්නා නමුත් නොකඩවා කණස්සල්ලෙන් සිටියි නම්, එවිට එය සිහසුනක් මත අසුන් ගැනීමක්ද, කණස්සල්ලක්ද? භාග්‍යය පිරිනමන්නා වන පරමාත්ම දෙවියන්, ඔබගේ නළලේ ඔබගේ ශ්‍රේෂ්ඨ භාග්‍යයේ රේඛාව ඇඳ තිබේ, එබැවින් ඔබ සැහැල්ලු අධිරාජවරුන් බවට පත් වී ඇත. එබැවින් සෑම විටම ඔබගේ නළලේ ඔබගේ

ශ්‍රේෂ්ඨ භාග්‍යයේ රේඛාව නොකඩවා දකින්න. අපූරුයි මගේ දේවමය භාග්‍යය, අපූරුයි! මෙම ආධ්‍යාත්මික කුල්මත් බව පවත්වාගන්න, එවිට සියලු කණස්සලු අවසන් වෙයි.

**පාඨය:** ඒකාග්‍රතාවයේ බලයෙන් සහ ආධ්‍යාත්මික සේවය තුළින් ජීවාත්ම කැඳවීම, සැබෑ සේවයයි.

***** ඕම ශාන්ති *****